# පතෝල

## *ට්‍රයිකොසැන්තස් කුකුමරීනා* - *Trichosanthes cucumerina*

## කුලය - කුකර්බිටේසී

ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රිය එළවළු බෝගයක් වන පතෝල සම්භවය වී ඇත්තේ නිවර්තන ආසියාවේය. මාතලේ, නුවර, රත්නපුර, හම්බන්තොට, කුරුණෑගල වැනි දිස්ත්‍රික්ක වල විශාල වශයෙන් මෙම බෝගය වගාවේ.

### දේශගුණික අවශ්‍යතා

උණුසුම් දේශගුණික තත්ව ප්‍රියකරන බෝගයකි. මුහුදු මට්ටමේ සිට මීටර් 500 පමණ උසක් දක්වා වු ප්‍රදේශවල මෙය සාර්ථකව වගා කළ හැකිය. වියළි කලාපයේ යල් කන්නයේදී ද, තෙත් කලාපයේ වසර පුරාම පාභේද පතෝල වගා කළ හැකිය. කෙසේ වුවද තද වර්ෂා කාල මඟ හැර වගා කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකිය.

### පස

කාබනික ද්‍රව්‍ය මැනවින් අඩංගු හොඳින් ජලය බැසයන පසක් වගාව සඳහා වඩා සුදුසුය. පසෙහි තිබිය යුතු පී.එච් අගය 5.5 - 7.5 පමණ වේ.

### බිම් සැකසීම

ඉඩම හොඳින් සී සා කැට පොඩි කර ගන්න. නියමිත පරතරයට සෙ.මී.30×30×30 ප්‍රමාණයේ වලවල් සකසාගන්න.

### නිර්දේශිත ප්‍රභේද

**ටී.ඒ.2**

මීටරයකට වඩා දිග කරල් අළු සුදු පාටය. මේරීමත් සමඟ කරල් වල තද කොළ පාට ඉරි ඇති වේ.

**එම්.අයි.(කෙටි)**

අළු සුදු පැහැති කරල මීටර 1/2 පමණ දිගය.

**තින්නවේලි**

කරලක දිග මීටර් 3/4 පමණ වේ. මාංසල බවින් වැඩි මෙම කරල් අළු-සුදු පාටය. මේරීමත් සමඟ කරලේ සුදු පැහැති ඉරි ඇතිවේ.

### බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයකට - කි.ග්‍රෑ. 4

### පරතරය

මීටර් 1.5×1.5

### සිටුවීම

දිරාපත්වූ කාබනික ද්‍රව්‍ය සහ මතුපිට පස් මිශ්‍ර කර වල පුරවාගන්න. බීජ සිටුවීමට දින 2 - 3 පෙර එක් වලකට මූලික පොහොර ලෙස නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය යොදන්න.

සකසාගත් වලෙහි එකිනෙකට තරමක් දුරින් බීජ 3 පමණ සෙ.මී. 2-3 පමණ ගැඹුරින් සිටුවා හොඳින් ජලය සපයන්න. දින 5-8 දී බීජ ප්‍රරෝහනයවේ.

### පැල තුනී කිරීම

බීජ පැල වී සති 2 පමණ ගතවූවිට එක් වලක නිරෝගී පැල 2 පමණක් ඉතිරිකර වැඩි පැල ගලවා දමන්න.

### වැල් පුහුණු කිරීම

මීටර් 2 පමණ උස ශක්තිමත් පන්දලමකට වැල් යොමු කරන්න. පන්දලමට පහතින් වැලෙහි ප්‍රධාන කඳෙන් හටගන්නා පාර්ශ්වික අතු ඉවත් කරන්න.

### පොහොර යෙදීම

පහත සඳහන් අන්දමට රසායනික පොහොර යොදා වගාවෙන් වැඩි අස්වැන්නක් ලබා ගන්න.

| | යූරියා හෙ.කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ.කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ.කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | 75 | 200 | 60 |
| පැල මතුවී සති 4 | 75 | - | 60 |
| පැල මතුවී සති 8 | 75 | - | 60 |

## වල් පැලෑටි පාලනය

හෝගයේ මුල් අවස්ථාවේදී වල්පැල පාලනය පිළිබඳව සැලකිලිමත්වන්න. වැල් හොඳින් වැඩී මැස්ස ආවරණය කරගත් පසුව වල් පැලෑටි පාලනය එතරම් ගැටළුවක් නොවේ.

## ජල සම්පාදනය

බීජ ප්‍රරෝහනය වන තෙක් දිනපතාම පාහේ ජලය සපයන්න. ඉන්පසු අවශ්‍යතාවය අනුව වරින් වර ජලය සපයන්න. වැල් වටා වසුනක් යෙදීමෙන් වියළි කාලගුණික තත්ව පවතිනවිට පස වියළී යාම අඩුකර ගත හැකිය.

## කෘමි හා රෝග පාලනය

### ඉල් මැස්සා

කරල් තුල ඉල් මැස්සාගේ කීටයා විසින් සිදුකරන හානිය නිසා කරල් කුණුවේ. කුඩා අවධියේදීම පොලිතින් කවර යොදා කරල් ආවරණය කරන්න. දරුණු හානියක් පවතිනවිට ෆෙන්තියොන් වැනි නිර්දේශිත කෘමිනාශකයක් වගාවට යොදන්න.

මෙයට අමතරව අවුලකපෝරා කුරුමිණීන්, හබල්පාද මකුණන් හා එපිලැග්නා කුරුමිණීන් නිසාද වගාවට හානි ඇති විය හැකිය.

මුල ගැටිති වටපණුවන් පාලනය කිරීම සඳහා බෝග මාරුව, කාබනික පොහොර මැනවින් වගාවට යෙදීම කළ හැකිය. එසේම 3% කාබොෆියුරාන් කැට ග්‍රෑම් 2 පමණ බීජ සිටුවන අවස්ථාවේදී සෑම වලකටම යෙදීමද කළ හැකිය.

පතෝල වගාවන් සඳහා යටිපුස් රෝගය හා පිටි පුස් රෝගය දරුණු ලෙස වැළඳිය හැකිය. එවිට නිර්දේශිත දිලීර නාශකයක් පත්‍රවලට යොදන්න. මෘදු කුණුවීම නිසා වැලෙහි පාදස්ථ කොටසට හානි ඇතිවුවහොත් පසෙහි ජලවහනය දියුණු කරන්න. පස බුරුල්කර වාතනය දියුණු කරන්න.

## අස්වනු නෙලීම

සිටුවා දින 60 - 75 දී අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. දින 4 කට වරක් පමණ බැගින් අස්වනු නෙලාගත හැකිය.

## අස්වැන්න

උසස් වගා පාලන තත්ව යටතේ හෙක්ටයාරයකට කි.ග්‍රෑම් 20,000 පමණ අස්වැන්නක් ලබාගත හැකිය.

## අස්වනු පරිහරණය

නෙලාගත් කරල්වලට තුවාලවීම වලකා ගැනීම සඳහා ලණු පැදුරු හෝ පොල් අතු වලින් ආවරණය කර මිටි බඳින්න. හොඳින් පරිහරණය කරන ලද කරල් දින 7-10 පමණ ගුණාත්මය පහත නොවැටී තබාගත හැකිය.